සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
**Department of Divineguma Development**

1වන අධියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1st 4th floor, **Sethsiripaya ,Battaramulla**

මගේ අංකය / எனது இல / My No } DDD/HO/PM/08
ඔබේ අංකය / உமது இல / Your No } ...................................
දිනය / திகதி / Date } 2016.06.02

<u>ඉතා වැදගත්</u>

සියළුම අංශ ප්‍රධානීන්
සිළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරු

<u>ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන - 2016 ජුනි 05</u>

උක්ත කරුණ සම්බන්ධව ජනාධිපති ලේකම්තුමාවිසින් එවා ඇති අංක PS/DSP/03/16 හා 2016.05.04 දිනැති චක්‍රලේඛය හා බැදේ.

අදාළ චක්‍රලේඛයේ සඳහන් පරිදි, පරිසර සංරක්ෂණයපිළිබඳව ලෝකවාසි ජනතාව දැනුවත් කිරීමේ හා විවිධ පරිසර ගැටළුපිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය යොමු කර විමේ අරමුණින් සැම වසරකම ජුනි මස 05 වන දින “ජගත් පරිසර දිනය“ සමරනු ලබයි.

මෙවර, 2016. වසරේ ජගත් පරිසර දිනයේ තේමා පාඨය වනුයේ, “වන ජීවි සම්පත් නීති විරෝධි ලෙස අලෙවි කිරිමටඑරෙහිවෙමු“ (FIGHT AGAINST THE ILLEGAL TRADE IN WILDLIFE)යන්නයි.

අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි, මැයි 30 සිට ජුනි 05 දක්වා පූර්ව සතිය ‘‘ ජාතික පරිසර සතිය “ ලෙස ප්‍රකාශයට පත්කර ඇති අතර, මෙම කාලය තුල සියළු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල දායකත්වයෙන් විශේෂ පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටඅමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව මැයි මස 30 වන දින සිට ජුනි මස 05 වන දින දක්වා ක්‍රියාත්මක පරිසර සතිය තුල පහත සඳහන් පරිදි වැඩසටහන් සංවිධානය කොට ක්‍රියාත්මක කිරිමට කටයුතු කරන ලෙස ජනාධිපති ලේකම් කාර්යාලය විසින් උපදෙස් ලබා දී ඇත.

I. සියළුම රාජ්‍ය ආයතනවල ආයතන ප්‍රධානීන් විසින් ජගත් පරිසර දිනයේ වැදගත්කම පිළිබදවකාර්ය මණ්ඩල දැනුවත් කිරීම, කාර්යාල පරිශ්‍ර පවිත්‍ර කිරීමේ ශ්‍රමදාන පැවැත්වීම,කාර්යල පරිශ්‍ර තුළ කසළ වර්ගීකරණය කර ( ප්ලාස්ටික්/ පොලිතීන් / කඩදාසි /විදුරු /ලෝහකාබනික ද්‍රව්‍ය ආදී ලෙස ) බැහැර කිරීම අරම්භ කිරීම සහ පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
II. පොලිතින් හා ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සහ පරිසර හිතකාමී ඇසුරුම් භාවිතය ප්‍රවර්ධනය කිරීම
III. නීලහරිත ලස්සන ලංකා වැඩසටහන යටතේ පරිසර හිතකාමී “ හරිත ගම්මාන “ සහ “හරිතනගර ” වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
IV. ප්‍රජා සහභාගිත්වයෙන් පරිසර සංවේදී භූමි සංරක්ෂණ ක්‍රම රුක් රෝපණ වැඩසටහන් ඇතුළු විවිධ පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
V. හානියට පත් භූමි පුනරුත්තාපනය කිරීම
VI. පරිසර සංරක්ෂණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர்தலைமையதிபதி / Additional Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2887280 | 011-2873996 | **011- 2887722**(Hotline) |
| E-mail- | dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | |

VII. පාරිසරික ප්‍රදර්ශන පැවැත්වීම
VIII. හරිත රැකියා හඳුනාගැනීම හා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
IX. හරිත වෙරළ සංකල්පය ක්‍රියාවට නංවමින් වෙරළ තීරයේ තුරු ආවරණය වැඩි දියුණු කිරීම
X. තෙත් බිම් ප්‍රදේශ සංරක්ෂණ කිරීම
XI. වස විස නැති කාබනික ගොවිතැන ප්‍රවර්ධන කිරීම

ඉහත වැඩසටහන් ක්‍රියාවට නැංවීමේදී අදාළ පාර්ශවයන් දැනුවත් කර දේශපාලන නායකත්වයේ මඟපෙන්වීම සහ සහභාගිත්වය ලබා ගන්නා ලෙස ද දන්වමි.

මෙම වැඩසටහනේ ප්‍රගතිය ජනාධිපති කාර්යසාධන මෙහෙයුම්කාර්යාලය වෙත වාර්තා කළ යුතුව ඇති හෙයින්, අදාළ සතිය තුළ වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහාඉහළමප්‍රමුඛතාවය දී කටයුතු කරන ලෙසද, ඔබ විසින් දිස්ත්‍රික්කයතුල ක්‍රියාත්මක කල වැඩසටහන් පිළිබඳ විස්තර ඇතුලත් වාර්තාවක් 2016.06.20 දිනට පෙර අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම් )වෙත එවන ලෙසද දන්වමි.

තවද,මෙම වැඩසටහන් ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා, දිස්ත්‍රික්කයේ ඉදිරි වාර්ෂික සැලසුම්වලටඇතුලත් කර ගැනීමට කටයුතු කරන ලෙසද,වැඩිදුරටත්දන්වමි.

චන්ද්‍රා වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව

පිටපත් -:

1. ජනාධිපති ලේකම් - කා.දැ.ගැ.ස.
2. ලේකම් සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.